# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2453/39 – 2025 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා – 2025.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සල්පිටි කෝරලේ - පල්ලේ පත්තුව සුළු කොට්ඨාසයේ, කටුබැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක CO/MRT/2018/04 හා 2018.01.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර “ඒ” – ප්‍රමාණය: හෙක්. 0.0729**

උතුරට: ශ්‍රී රාහුල මාවත සහ පී.ජී. අනිල් හිමිකම් කියන දෙල්ගහවත්ත *නොහොත්* බැටරිවත්ත; නැගෙනහිරට: පී.ජී. අනිල් හිමිකම් කියන සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි දෙල්ගහවත්ත *නොහොත්* බැටරිවත්ත; දකුණට: කැබලි අක්ෂර, බී.සී. සහ රජය හිමිකම් කියන ශ්‍රී රාහුල මහා විද්‍යාලය; බටහිරට: තෙන්නකෝන් මුදියන්සේලාගේ වර්ණරත්න සහ තවත් අය හිමිකම් කියන සපුගහවත්ත.

02. **කැබලි අක්ෂර “බී” – දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත, වරි. අංක 366, ශ්‍රී රාහුල මාවත - ප්‍රමාණය: හෙක්. 1.3942**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි දෙල්ගහවත්ත නොහොත් බැටරිවත්ත; නැගෙනහිරට: බොල්ගොඩ ගඟ; දකුණට: සිමෙන්ති කාණුව, රජය හිමිකම් කියන දන්දෙනියවත්ත, ප්‍රවේශ මාර්ගය සහ කැබලි අක්ෂර සී; බටහිරට: කැබලි අක්ෂර සී.

03. **කැබලි අක්ෂර “සී” – ප්‍රමාණය: හෙක්. 0.0735**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ ප්‍රවේශ මාර්ගය; දකුණට: ප්‍රවේශ මාර්ගය සහ කපන ලද කාණුව; බටහිරට: කපන ලද කාණුව සහ රජය හිමිකම් කියන ශ්‍රී රාහුල මහා විද්‍යාලය.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2017/UD/500.
2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 09 – 0104


1A – G 45345 – 14 (2025/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*